රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:18/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1990 මාර්තු මස 14 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
සංස්ථා සභාපතිවරුන් වෙත.

**<u>බීමත්කම, මත්පැන් ගඳ වහනය වීම හෝ</u>**
**<u>විෂ මත්ද්‍රව්‍ය භාවිතය.</u>**

1985.10.24 දිනැති අංක:308 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත, ආයතන සංග්‍රහයේ ii කාණ්ඩයේ xivii පරිච්ඡේදය තවදුරටත් පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

2:1. නිලධාරියකු රාජකාරියෙහි නිරතව සිටියදී හෝ" කාර්ය වියුක්තව සිටියදී, කාර්යාලයේ භූමිභාගය තුළ ගැවසෙන විට බීමත්ව සිටීම, මත්පැන් ගඳ වහනය වීම හෝ විෂ මත්ද්‍රව්‍ය භාවිතා කර සිටීම එම නිලධාරියාට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හේතුවක් වන්නේය.

2:2 බීමත්ව සිටියදී හෝ" විෂ මත්ද්‍රව්‍ය භාවිතා කර සිටියදී කළ වරදක් සම්බන්ධයෙන්" වරදකරු කරනු ලැබූ නිලධරයකු පළමු වතාවට උසාවියකදී රදකරං බවට පමුණුවනු ලංබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලබන්නේය.

2:3 බීමත්ව සිටීම හෝ මත්පැන් ගඳ වහනය වීම ගැන කරනු ලබන දෙපාර්තමේන්තු පරීක්ෂණයකදී නිලධරයකු වරද කළ බව තහවුරු කිරීමට මාණ්ඩලික මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් දෙදෙනෙකුගේ සාක්ෂි ප්‍රමාණවත් වන අතර, වරදකරු බවට ඔප්පු වුවහොත් එවිට එම නිලධරයා සේවයෙන් පහ කරනු ලැබේ.

විෂ මත් ද්‍රව්‍ය පාවිච්චි කර ඇති බවට සැක කරනු ලබන නිලධරයෙකු එම වරද කළ බව තහවුරු කිරීම සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකුගේ හෝ රජයේ වෛද්‍ය නිලධාරීයෙකුගේ වාර්තාවක් ලබාගත යුතුය. නිලධරයකු එසේ වරදකරු බවට ඔප්පු වුවහොත් එවිට එම නිලධරයා සේවයෙන් පහ කරනු ලැබේ.

02 මෙම චක්‍රලේඛයේ විධිවිධාන රාජ්‍ය සංස්ථාවල සේවකයන්ට ද බලපැවැත්වේ.

අ.කලේ/පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.